# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2009 අංක 18 දරන මුදල් (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 මාර්තු මස 31 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 අප්‍රේල් මස 03 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## 2009 අංක 18 දරන මුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2009 මාර්තු මස 31 වන දින]

එල්. ඩී.—ඕ. 54/2008.

## 2005 අංක 5 දරන මුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 2009 අංක 18 දරන මුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2005 අංක 5 දරන මුදල් පනතේ III වන කොටසේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2005 අංක 5 දරන මුදල් පනතේ III වන කොටසේ 13 වන වගන්තියේ (ඉදි කිරීම් කර්මාන්ත සහතික අරමුදල් බද්ද) "එක් එක් කොන්ත්‍රාත්කරු හෝ උප කොන්ත්‍රාත්කරු විසින් ගෙවිය යුතු සම්පූර්ණ පිරිවැය මත පදනම් විය යුතු ය" යන වචන වෙනුවට "එක් එක් කොන්ත්‍රාත්කරුට හෝ උප කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු සම්පූර්ණ කොන්ත්‍රාත් වටිනාකම මත පදනම් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට 13අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 13අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

"යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් බද්ද අඩු කරගත යුතු බව.

13අ. (1) 2005 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු ඇතුළත් වූ යම් ගිවිසුමක් යටතේ, අවස්ථාවෝචිත පරිදි, යම් කොන්ත්‍රාත්කරුවකු හෝ උප කොන්ත්‍රාත්කරුවකු විසින් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරනු ලබන යම් ඉදි කිරීම් කොන්ත්‍රාත්තුවක හෝ උප කොන්ත්‍රාත්තුවක වටිනාකම මත යම් මුදලක් යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් එම කොන්ත්‍රාත්කරුට හෝ උපකොන්ත්‍රාත්කරුට 2009 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ගෙවනු ලබන අවස්ථාවක එම ගෙවන මුදලින් මේ පනතේ II වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන උචිත අනුප්‍රමාණයකට අනුව ඉදි කිරීම්

2—PL 003767 — 3,500 (2009/03)

කර්මාන්ත සහතික අරමුදල් බද්ද, අඩු කළ යුතු බවටත්, එසේ අඩු කර ගන්නා ලද මුදල පිළිබඳ විස්තර දැක්වෙන ප්‍රකාශයක් කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන ආකෘති පත්‍රයක් මගින් එම කොන්ත්‍රාත්කරුට හෝ උප කොන්ත්‍රාත්කරුට නිකුත් කළ යුතු බවටත්, එම තැනැත්තාට හෝ හවුල් ව්‍යාපාරයට නියම කරනු ලැබිය යුතු ය.

(2) ආදායම් බද්ද අඩු කිරීම, ආදායම් බද්ද අඩු කිරීම පැහැර හැරීම්, බැංකු සහ මූල්‍ය ආයතන වෙත තක්සේරු කිරීම් නිකුත් කිරීම, ගෙවීම් පැහැර හැරීම සම්බන්ධයෙන් වූ අභියාචන සහ දණ්ඩන පිළිබඳව වූ බැංකු සහ මූල්‍ය ආයතනවල කාර්යභාරයට අදාළ 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 140, 142, 143, 144 සහ 145 යන වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් බද්ද, ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් බද්ද අඩුකිරීම, ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් බද්ද අඩුකිරීම පැහැර හැරීම, එකී තැනැත්තන් සහ හවුල් ව්‍යාපාර මත තක්සේරු කිරීම් නිකුත් කිරීම, ගෙවීම් පැහැර හැරීම සම්බන්ධයෙන් වූ අභියාචන සහ දණ්ඩනවලට අදාළ විය යුතු ය.

(3) ඉහත කී උපවගන්ති යටතේ ඉදි කිරීම් කර්මාන්ත සහතික අරමුදල් බද්ද වශයෙන් අඩු කර ගන්නා ලද මුදල, එම මුදල අඩු කරගත් මාසයට පසුව එළඹෙන මාසයේ පහළොස් වන දින හෝ එදිනට පෙර කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වා ඇති ආකෘති පත්‍රයක් මගින් ඉදිරිපත් කරනු ලබන එම අඩු කිරීම් පිළිබඳ විස්තර සඳහන් වන ප්‍රකාශයක් ද සමග එම තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කළ යුතු ය.

(4) එසේ අඩු කර ගැනීමට සහ කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කිරීමට අදාළ සහතිකය ඉදිරිපත් කිරීමෙන් එම මුදල ගෙවන අවස්ථාවේ දී අදාළ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් ඉදි

කිරීම් කර්මාන්ත සහතික අරමුදල් බද්ද වශයෙන් අඩු කර ගන්නා ලද මුදල 13 වන වගන්තිය යටතේ එම කොන්ත්‍රාත්කරු හෝ උප කොන්ත්‍රාත්කරු විසින් ගෙවිය යුතු ඉදි කිරීම් කර්මාන්ත සහතික අරමුදල බදු මුදලින් අඩු කර ගැනීමට එම කොන්ත්‍රාත්කරුට හෝ උප කොන්ත්‍රාත්කරුට හිමිකමක් තිබිය යුතු ය.”.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ “13 වගන්තිය යටතේ ගෙවිය යුතු ඉදි කිරීම් කර්මාන්ත සහතික අරමුදල බද්ද එක් එක් කොන්ත්‍රාත් මුදල්, කොන්ත්‍රාත්කරුට ලැබෙන අවස්ථාවේ දී ඉදි කිරීම් කොන්ත්‍රාත්කරු විසින්” යන වචන වෙනුවට “13 වන වගන්තිය යටතේ කොන්ත්‍රාත්කරු හෝ උප කොන්ත්‍රාත්කරු විසින් ගෙවිය යුතු ඉදි කිරීම් කර්මාන්ත සහතික අරමුදල බද්දෙන් 13 අ වගන්තිය යටතේ ගෙවන තැනැත්තා විසින් අඩු කර ගනු ලබන බද්ද අඩු කිරීමෙන් පසු ඉතිරි වන මුදල එක් එක් කොන්ත්‍රාත් මුදල් ලැබෙන අවස්ථාවේ දී, ඉදි කිරීම් කොන්ත්‍රාත්කරු හෝ උප කොන්ත්‍රාත්කරු විසින්” යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ “කොන්ත්‍රාත් වටිනාකම” යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

“ “කොන්ත්‍රාත් වටිනාකම” යන්නෙන් පිළිගැනීමේ ලිපියෙහි සඳහන් වන්නා වූ ද ගිවිසුමේ විධිවිධානවලට අනුකූලව ඉන්පසු වෙනස් කරනු ලබන්නා වූ ද මුදල හෝ මුදල් අදහස් වේ. එම කොන්ත්‍රාත් වටිනාකම වනුයේ ව්‍යාපෘතියේ ඉදි කිරීම් කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධයෙන් එළඹ ඇති එක් එක් කොන්ත්‍රාත්තුව හෝ කොන්ත්‍රාත්තු කීපයක මුළු එකතුව වන අතර, උප කොන්ත්‍රාත් වටිනාකම, සැපයුම් කොන්ත්‍රාත් වටිනාකම සහ වැඩ කටයුතු ඉටු කිරීමේ දී දැරීමට සිදු වන වෙනත් ඉදි කිරීම් වියදම් ද ඊට ඇතුළත් වන නමුත්, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යටතේ යම් එකතු කළ අගය මත බද්දක් ඊට ඇතුළත් නොවිය යුතු ය; සහ”.

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමු වන උපලේඛනය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමු වන උපලේඛනයේ 4 වන, 5 වන සහ 6 වන අයිතම වෙනුවට පහත දැක්වෙන අලුත් අයිතමය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"4. (අ) 2005 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන සහ 2006 මාර්තු මාසයෙන් අවසන් වන කාල සීමාවට අදාළ වන තාක් දුරට (XV, XVI සහ XVII වන පරිච්ඡේදවල විධිවිධාන සහ 33 වන වගන්තියේ සහ 61 වන වගන්තියේ විධිවිධාන හැර) 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත;

(ආ) 2006 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වී 2008 මාර්තු මාසයෙන් අවසන් වන කාල සීමාව සඳහා අදාළ වන තාක් දුරට (XVI, XVII, XVIII සහ XXI වන පරිච්ඡේදවල විධිවිධාන සහ 36 වන වගන්තියේ සහ 65 වන වගන්තියේ විධිවිධාන හැර) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත; සහ

(ඇ) යම් සමාගමකට සහ 2008 අප්‍රේල් මස 1 වන දිනයට පසුව ආරම්භ වන කාල සීමාවක් සම්බන්ධයෙන් අදාළ වනතාක් දුරට (XVI, XVII, XVIII සහ XXI වන පරිච්ඡේදවල විධිවිධාන සහ 36 වන වගන්තියේ සහ 65 වන වගන්තියේ විධිවිධාන හැර) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත.".

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි 2 වන අයිතමයේ "රුපියල් මිලියන පනහක් නොඉක්මවන" යන වචන වෙනුවට "රුපියල් මිලියන පනහකට අඩු" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එහි 3 වන අයිතමයෙහි "රුපියල් මිලියන එකසිය පනහක් නොඉක්මවන" යන වචන වෙනුවට "රුපියල් මිලියන එකසිය පනහකට අඩු" යන වචන ආදේශ කිරීමෙන්.

8. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.